
# සිංහල මාස



**සෝ**ම නොහොත් සාවන නමැති චන්ද්‍ර වර්ෂ සහ සෞර නොහොත් සූර්ය වර්ෂ යනුවෙන් වර්ෂ ක්‍රම දෙකක් ලෝකයේ භාවිතා වෙනවා. චන්ද්‍ර වර්ෂ කියන්නෙ චන්ද්‍රයා පෘථිවිය වටා ගමන් කිරීමට ගතවෙන දින 30 මාසයක් වශයෙන් සලකා එබඳු මාස 12 කට එන දින 360 කින් සකස් කරගත් වර්ෂ ක්‍රමයක්. සූර්ය වර්ෂ කියන්නෙ පෘථිවිය සූර්යා වටා එක රවුමක් යාමට ගතවෙන දින 365 ක පමණ කාලය පදනම් කරගත් වර්ෂ ක්‍රමයකුයි. ක්‍රිස්තු උප්පත්තියෙන් ආරම්භ වෙන ක්‍රිස්තු වර්ෂ යනුවෙන් සඳහන්වෙන්නේ දින 365 හේ සූර්ය වර්ෂ ක්‍රමයක්.

මහමත්තුමා මක්කමේ සිට මෙදිනාවට පැන ගිය දින සිට ආරම්භ වෙන මුස්ලිම් වර්ෂ ක්‍රමයේ පදනම දින 360 වේ චන්ද්‍ර වර්ෂයයි. අප්‍රෙල් මස 13 හෝ 14 වෙනි දින වෛදික ජ්‍යෝතිෂය අනුව සූර්යා මීන රාශියෙන් මීන රාශියට සංක්‍රමණය වීම නිමිති කරගෙන සිංහල හින්දු අවුරුද්ද මුල් කරගත් ශකරාජ වර්ෂ නම් සූර්ය වර්ෂ ක්‍රමය ආරම්භ වන්නේ ක්‍රිස්තු වර්ෂ 188 සිටයි. එම වර්ෂ ක්‍රමයේ මාස ගණන් කෙරෙන්නේ සූර්යා ලග්නයක් නමැති නක්ෂත්‍ර රාශියක ගමන් කිරීමට ගතවෙන කාලය අනුවයි.

ඒ අනුව ලග්න රාශි 12 පදනම් කරගත් සූර්ය මාස 12 හැඳින්වෙන්නේ මේෂ රවිය, වෘෂභ රවිය, මිථුන රවිය, කටක රවිය, සිංහ රවිය, කන්‍යා රවිය, තුලා රවිය, වෘශ්චික රවිය, ධනු රවිය, මකර රවිය හා කුම්භ රවිය යන නම්වලින්. බුද්ධ පරිනිර්වාණයෙන් ආරම්භ වෙන බුද්ධ වර්ෂ නම් චන්ද්‍ර වර්ෂ ක්‍රමයට අයත් චන්ද්‍ර මාස 12 හැඳින්වීම සඳහා වෙනම පාලි නම් තිබුණත් සිංහලයේදී එම මාස හැඳින්වෙන්නේ වෙසක්, පොසොන්, ඇසළ, නිකිණි, බිනර, වප්, ඉල්, උඳුවප්, දුරුතු, නවම්, මැදින්, බක් යන සිංහල නම්වලින්. ඒ හැම නමකම කිසියම් අර්ථවත් භාවයක් දක්නට ලැබෙනවා.

වෙසක් (වෙස්අක්) යනු ස්වභාව ධර්මය වසන්තශ්‍රීයෙන් උපරිම ලෙස ආඪ්‍ය සම්පන්නවී සෞන්දර්යයෙන් අග්‍රතම වේෂයක් දරන මාසයයි. මල් යන අරුතැති පොසොන් යනු දුවන වැහි නොහොත් මල් වැහි වහින මාසයයි. ඇසළ (ඇස් අළ) යනු පස්වග තවුසන්ගේ දහම් ඇස නොහොත් දහම් දකින නුවණැස ඇරිය (අළ) මාසයයි.

නිකිණි යනු වස්සානයේදී භාවානායෝගීව වසන භික්ෂූන් මිල දී ගතනොහැකි (නිකිණි) ධ්‍යාන සුවයක් අත්දකින මාසයයි. බිනර යනු ධ්‍යාන භාවනා මගින් මාර්ගපල ලබන අභිනරයන් නොහොත් බිනරයන් බිහිවන මාසයයි.

වප් යනු වපුරන මාසයයි. සම්බුදු දහම ලොව පුරා වැපිරීම සඳහා බිනරයන් බවට පත්වී සිටි ප්‍රථම රහතන් වහන්සේලා හැටනම ධර්මදූතයන් ලෙස හැම දිසාවකටම පිටත්කර හරින ලද්දේ මෙම මාසයේදීය. එසේම ශ්‍රී ලංකාවේ මහ ගොවිතැන සඳහා බිත්තර වී වපුරනු ලබන්නේත් මෙම මාසයේදී. ඉල් යනු ශීත කාලය ඇරඹීමේ පෙරනිමිත් තක් ලෙස වායු ගෝලය සිහිල් (ඉල්) වීගෙන යන මාසයයි. උඳුවප් යනු දිනිඳු නම් සූර්යා ශීත සමයේ මීදුම් පටල මැදින් ධාන්‍ය වපුරන්නා සේ හිරු කිරණ විහිදවන මාසයයි.

දුරු සෘතුව නොහොත් දුරුතු මාසය යනු ශ්‍රී ලංකාවට ඉතාමත්ම දුරින් ඉර ගමන්කරන මාසයයි. නවම් යනු සීතාධික සෘතුව ගෙවී යාමත් සමග සොබා දහම වසන්තයට සූදානම් වෙමින් නව පණක් ලබන මාසයයිග මහා ධාන්‍ය යන අරුතැති මැදින් යනු මහ ගොවිතැනේ අස්වැන්න කපා පාගාගනු ලබන මාසයයි. භාග්‍යවන්ත යන අරුතැති බක් යනු මහ ගොවිතැනේ අස්වැන්නෙන් අටුකොටු පිරීතිරී යද්දී වසන්තයේ උදාවත් සමග ගස්වැල් මල්පල බරවී වසන්ත සැණකෙළිය සඳහා සොබාදහම සැරසෙන භාග්‍යවන්ත මාසයයි.

♦ ***සම්මානිත මහාචාර්ය***
***ටී. එස්. අබේවික්‍රම***
**Harrow UK**


Duke's Court Travel

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £300 + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £223 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £220 + Taxes |
| Emirates | Emirates | fr £480 + Taxes |
| ETIHAD AIRWAYS | Etihad Airways | fr £211 + Taxes |
| OMAN AIR | Oman Air | fr £199 + Taxes |
| JET AIRWAYS | Jet Airways | fr £165 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

ATOL 3045 AITO IATA

204 King Street, London W6 0RA


## ✻ 2011 ධර්මපාල සැමරුම් උත්සවය ✻

**ලන්ඩන් බෞද්ධ විහාරයේ ආරම්භක ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ 147 වෙනි ජන්ම දිනය සහ ලන්ඩන් බෞද්ධ විහාරය ආරම්භ කොට වසර 85 ක් පිරීම නිමිති**



**කරගෙන 2011 සැප්තැම්බර් මස 17 සහ 18 යන දෙදින *ලන්ඩන් බෞද්ධ විහාරයේ පැවැත්වෙන උත්සව කටයුතු :***

**17දා සවස 5 ආචාර්ය අමල් ගුණසේන මහතාගේ දේශනය**
**6. 30 - බෝධිපූජාව**
**7. 30 - මධ්‍යම රාත්‍රි දක්වා පිරිත් සජ්ජායනය**

**18 වෙනිදා උදේ 7 ට සංඝයා වහන්සේලාට හීල් දානය සහ අනතුරුව ධර්මපාලතුමා ඇතුළු විහාරස්ථානයේ දියුණුවට කටයුතු කළ ගිහි පැවිදි සියළු දෙනාට පිංපැමිණවීම සහ සෙත් පැතීම. මේ උතුම් කටයුත්තට සහභාගිවන ලෙස සුපින්වත් ඔබ සැමට ගෞරවයෙන් ආරාධනා කෙරේ.**

## එක්සත් රාජධානියට පත්ව ආ නව ශ්‍රීලංකා මහකොමසාරිස්වරයා

## The New Sri Lanka High Commissioner in the UK

**එ**ක්සත් රාජධානියට නව මහකොම සාරිස්වරයෙක් ශ්‍රීලංකා රජය විසින් පත් කරනු ලැබ සිටියි. ඒ දොස්තර ක්‍රිස් නෝනිස් මහතා ය. ඒ මහතා මෙම සැප්තැම්බර් 1 වෙනිදා ලන්ඩන් කාර්යාලයේ සිය ධූරයේ වැඩ ආරම්භ කළේ ය.

ලන්ඩනයේ සුප්‍රකට රෝයල් ප්‍රී වෛද්‍ය පීඨයෙන්, ඉම්පීරියල් විදුහලෙන් හා ඇමරිකාවේ හාවඩ් වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිලත් නෝනිස් මහතා වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකාවේද එක්සත් රාජධානියේද සේවය කර තිබේ.

තවද නෝනිස් මහතා රාජකීය පොදුරාජ්‍ය මණ්ඩලීය සමාජයේ ( Royal Commonwealth Society) නියෝජ්‍ය සභාපතිවරයා ලෙස ද 2008 වසරේ දී පත්කරනු ලැබූ අතර ඒ ධූරය ලත් ප්‍රථම ලාංකිකයා ද ඔහු වන්නේ ය.

මහකොමසාරිස් ධූරය පිරිනමනු ලැබීමට ප්‍රථම වෛද්‍ය නෝනිස් මහතා කොළඹ සුප්‍රකට මැක්වුඩ් සමාගමේ සභාපතිවරයා ලෙස කටයුතු කළේ ය.



***වෛද්‍ය ක්‍රිස් නෝනිස් මහතා***
***Dr Chris Nonis***




ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

අප මත විශ්වාසය තබා, ලංකාවට මුදල් යවනා අපගේ දහස් ගනන් ගණුදෙනුකරුවන් ඔවුන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ක්ෂණිකව සහ සුරක්ෂිතව එතෙර සිටින තම ආදරණීයන් වෙත ලබා දෙන්නේ හද පිරි සතුටෙනි.

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාකා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

FAST CASH
SEND TODAY - COLLECT TODAY

Transfer Fees From only £5

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · SEYLAN BANK LIMITED · NSB · HSBC · PEOPLE'S BANK · සම්පත් බැංකුව SampathBank · NDB bank · Standard Chartered

Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි

www.efastcash.biz

020 8886 4488

Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT